# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2321/74 - 2023 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2023.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**උතුරු පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2(1)(A) වගන්තිය සමග කියවෙන නගර සභා ආඥාපනතේ 252 පරිච්ඡේදයේ 326 වගන්තිය යටතේ නියෝගය

උතුරු පළාත් ආණ්ඩුකාරවර ජීවන් ත්‍යාගරාජා මා වෙත පැවරී ඇති බලය මත 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2(1)(A) වගන්තිය සමගින් කියවෙන නගර සභා ආඥාපනතේ 326 වගන්තිය යටතේ සඳහන් කරන ලද නියෝගය මෙයින් සිදු කරමි.

**ජීවන් ත්‍යාගරාජා,**
ආණ්ඩුකාරවර,
උතුරු පළාත.

2023 පෙබරවාරි මස 28 වැනි දින,
ආණ්ඩුකාවර කාර්යාලය,
උතුරු පළාත.

**නියෝගය**

2023 වසර සඳහා වන අයවැය සම්මත වී නොමැති බැවින්, 2023.03.01 සිට 2023.03.14 දක්වා හෝ සභාව විසින් 2023 වර්ෂය සඳහා අයවැය සම්මත කරන දිනය දක්වා හෝ පළමුව පැමිණෙන දිනය දක්වා බලපැවැත්වෙන පරිදි 2023 වර්ෂය සඳහා යෝජිත ඇස්තමේන්තු තුළ පහත සඳහන් වියදම් පමණක් සිදුකිරීමට යාපනය මහ නගර සභාවේ නියෝජ්‍ය නගරාධිපතිවරයාට මෙම මෙයින් බලය පවරමි.

(1) වැටුප් හා දීමනා
(2) ගමන් දීමනා
(3) සැපයුම් සහ අවශ්‍යතා
(4) ප්‍රවාහන, සන්නිවේදන සහ උපයෝගිතා සේවා
(5) අලුත්වැඩියාව සහ නඩත්තුව
(6) පොළී ගෙවීම
(7) සභා විශ්‍රාම වැටුප් ගෙවීම්
(8) ලංකා බැංකු ලීසිං

EOG 03-0025

1A - PG 6247 — 07 (2023/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*